(a) පරමාණුක ක්‍රමාංකය වැඩිවන විට, විද්‍යුත් ධන ලක්ෂණ අඩු වේ.
(b) පරමාණුක ක්‍රමාංකය වැඩිවන විට, අයනික අරය වැඩි වේ.
(c) සාපේක්ෂ පරමාණුක ස්කන්ධය වැඩි වන විට, භාෂ්මික ලක්ෂණ වැඩි වේ.
(d) පරමාණුක ක්‍රමාංකය වැඩි වන විට, සල්ෆේට්වල ජලයේ ද්‍රාව්‍යතාව වැඩි වේ.

37. රතුකැට හා සම්බන්ධ වන මේ ප්‍රකාශවලින් කුමන එක/ කුමන ඒවා සත්‍ය වේද?
(a) එයට ස්ඵටික දැලිසක් තිබේ.
(b) එය ප්‍රධාන වශයෙන් $Fe_2O_3$ වලින් සමන්විත වේ.
(c) එය ඉතා ශුද්ධ ද්‍රව්‍යයකි. (d) එය විද්‍යුත් කුසන්නායකයකි.

38. මැග්නීසියම් නිෂ්පාදනය කිරීමේ දී මේවා ප්‍රයෝජනවත් වේ.
(a) මුහුදු ජලය (b) විද්‍යුතය (c) ජිප්සම් (d) මොනසයිට්

39. ෆීනෝල් මේවා සමග ප්‍රතික්‍රියා කරයි.
(a) $CH_3-C_6H_4-N_2^+Cl^-$ (b) තනුක නයිට්‍රික් අම්ලය
(c) තනුක හයිඩ්‍රොබ්‍රෝමික් අම්ලය (d)




40. වායුවක් පරිපූර්ණ ලෙස හැසිරේ නම්, වායු ස්කන්ධයක පරිමාව මේවා මත රඳා පවතී.
(a) වායුවේ ස්කන්ධය (b) වායුවේ උෂ්ණත්වය
(c) වායුවේ සාපේක්ෂ අණුක ස්කන්ධය
(d) වායුවේ අණුවක ඇති පරමාණු සංඛ්‍යාව

41 සිට 50 දක්වා ප්‍රශ්නවල වගන්ති දෙක බැගින් දී ඇත.

| පළමුවැනි වගන්තිය. | දෙවැනි වගන්තිය. |
|---|---|
| (1) සත්‍යය | සත්‍ය වන අතර පළමුවැන්න නිවැරදිව පහදා දෙයි. |
| (2) සත්‍යය | සත්‍ය වන නමුත් පළමුවැන්න නිවැරදිව පහදා නොදෙයි. |
| (3) සත්‍යය. | අසත්‍යය. |
| (4) අසත්‍යය. | සත්‍යය. |
| (5) අසත්‍යය. | අසත්‍යය. |

| පළමුවැනි වගන්තිය | දෙවැනි වගන්තිය |
|---|---|
| 41. $NH_3$ හි තාපාංකය $PH_3$ හි තාපාංකයට වඩා වැඩිය. | $NH_3$ අණුවේ තනි ඉලෙක්ට්‍රෝන යුග්මයක් තිබෙන නිසාය. |
| 42. අන්තරික මූලද්‍රව්‍ය හොඳ කුසන්නායක වේ. | අන්තරික මූලද්‍රව්‍යවල සචල ඉලෙක්ට්‍රෝන තිබෙන නිසාය. |
| 43. ජලීය NaOH උපයෝගී කරගනිමින් $CH_3CHO$ සහ $C_6H_5CHO$ එකිනෙකින් වෙන් කර හඳුනා ගත නොහැකිය. | සංයෝග දෙකම උදාසීන නිසාය. |
| 44. $CH_3CONH_2$, $C_6H_5NH_2$ වලටවඩා ප්‍රබල භෂ්මයකි. | $CH_3$ කාණ්ඩය ඉලෙක්ට්‍රෝන විකර්ෂණය කරන නිසාය. |
| 45. $NH_3$ වලට ඔක්සිකාරයක් ලෙස ක්‍රියා කළ නොහැකිය. | $NH_3$ හි නයිට්‍රජන් අවම ඔක්සිකරණ තත්ත්වයේ තිබෙන නිසාය. |
| 46. ඇලුමිනියම් සින්ක්වලට වඩා ප්‍රබල ඔක්සිහාරකයක් වේ. | ඇලුමිනියම් පරමාණුවකින් ඉලෙක්ට්‍රෝන තුනක් ලැබෙන අතර, සින්ක් පරමාණුවකින් ලැබෙන්නේ ඉලෙක්ට්‍රෝන දෙකක් පමණක් නිසාය. |
| 47. ඉහළ උෂ්ණත්ව $SO_2$ සහ $O_2$ අතර ප්‍රතික්‍රියාවට හිතකර නොවේ. | ප්‍රතික්‍රියාවක සක්‍රියන ශක්තිය උෂ්ණත්වය සමග වැඩිවන නිසාය. |
| 48. $CO_2$ අණුව කෝණාකාර වේ. | කාබන් පරමාණුවේ තනි ඉලෙක්ට්‍රෝන යුග්ම දෙකක් තිබෙන නිසාය. |
| 49. ශ්‍රී ලංකාවේ කෝස්ටික් සෝඩා නිෂ්පාදනය කිරීම සඳහා ඇමෝනියා -සෝඩා ක්‍රමය සුදුසු නොවේ. | ශ්‍රී ලංකාවේ ලාභ හයිඩ්‍රජන් ප්‍රභව නැති නිසාය. |
| 50. ජලීය NaOH සමඟ $Cl_3CCOCH_3$ ප්‍රතික්‍රියා කිරීමෙන් ලැබෙන්නේ $CH_3COONa$ නොව $Cl_3CCOONa$ | $Cl_3CCOOH$, $CH_3COOH$ වලට වඩා ප්‍රබල අම්ලයක් වන නිසාය. |

51. පහත දැක්වෙන සංයෝග ඒවායේ ආම්ලික ප්‍රබලතාව වැඩිවන ආකාරයට සකස් කරන්න.




(1) c<d<b<a (2) b<c<a<d (3) ...
(4) b<d<a<c (5) c<d<a<d

52. මධ්‍යසාරීය KOH සහ $CHCl_3$ සමග $C_2H_5NH_2$ + Cl ප්‍රතික්‍රියා කරන විට ලැබෙන ඵලය
(1) $C_2H_5NHOH$ (2) $C_2H_5NCCl$ (3) $C_2H_5NCO$
(4) $C_2H_5CN$ (5) $CH_3CH_2OH$

53. හයිඩ්‍රොකාබනයක හයිඩ්‍රජන් 9.44% ක් තිබේ. මේ හයිඩ්‍රොකාබනයේ සාපේක්ෂ අණුක ස්කන්ධය දළ වශයෙන් 100 වේ. හයිඩ්‍රොකාබනයේ නිරවද්‍ය සාපේක්ෂ අණුක ස්කන්ධය කුමක්ද?
(1) 106 (2) 104 (3) 102 (4) 98 (5) 96

54. සෙ. 27 දී හා පීඩනය රසදිය මිලිමීටර 720 දී වායුවකින් ග්‍රෑම් 2.500 ක පරිමාව ලීටර් 1.480 ක් විය. වායුවේ සාපේක්ෂ අණුක ස්කන්ධය කුමක්ද?
(1) 42.84 (2) 43.45 (3) 43.92 (4) 44.48 (5) 44.96

55. පරමාණුවල ඉලෙක්ට්‍රෝනික ශක්ති මට්ටම් සංකල්පය සමඟ වඩාත්ම කිට්ටුවෙන් සම්බන්ධ වී ඇත්තේ මින් කුමන විද්‍යාඥයාද?
(1) රදර්ෆර්ඩ් (2) තොම්සන් (3) බෙකරල්
(4) බෝර් (5) මාර්ස්ඩන්

56. $Pb(NO_3)_2$ සහ $Ba(NO_3)_2$ එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීම සඳහා උපයෝගී කරගත හැකි වන්නේ මින් කුමන එකද?
(1) ජලීය ඇමෝනියා (2) $(NH_4)_2SO_4$ (3) $K_2CrO_4$
(4) තනුක $H_2SO_4$ (5) මින් එකක්වත් නොවේ.

57. පෙරහන් කඩදාසිවල තවරන ලද මින් කුමන එක, $H_2S$ සහ $SO_2$ එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීම සඳහා උපයෝගී කරගත හැකිද
(1) $K_2Cr_2O_7$ / අම්ලය (2) $I_2$ / ජලීය KI
(3) ක්ෂාරීය $KMnO_4$ (4) ජලීය $CuSO_4$
(5) මින් එකක්වත් උපයෝගී කරගත නොහැකිය.

58. ද්‍රාවණයක, බර අනුව 75% ක් බෙන්සීන් සහ 25% ක් ටොලුයීන් තිබේ. කිසියම් උෂ්ණත්වයකදී සංශුද්ධ බෙන්සීන්වල සහ සංශුද්ධ ටොලුයීන්වල වාෂ්ප පීඩනය පිළිවෙලින් Pb සහ Pt වේ නම් එම උෂ්ණත්වයේදී ද්‍රාවණයේ වාෂ්ප පීඩනය කුමක් වේද?

(1) $\frac{75}{100}pb + \frac{25}{100}pt$ (2) $\frac{75}{78}pb + \frac{25}{92}pt$

(3) $\left(\frac{75}{78}pb + \frac{25}{92}pt\right)\left(\frac{1}{\frac{75}{78}+\frac{25}{92}}\right)$ (4) $\left(\frac{75}{78}pb + \frac{25}{92}pt\right)\left(\frac{1}{\frac{25}{78}+\frac{2}{92}}\right)$

(5) මින් එකක්වත් නොවේ.

59. $^{131}_{53}I$ හි අර්ධ ආයු කාලය දින 8ක් වේ. $^{131}_{53}I$ නිදර්ශකයක විකිරණශීලතාව ආරම්භ අගයෙන් තුනෙන් එකක් වීමට දළ වශයෙන් දින කීයක් ගත වේද?
(1) 9 (2) 10.5 (3) 12.5 (4) 14 (5) 11.5

60. සේරුවිල තිබෙන යපස්වල ඇති මුළු යකඩ ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා පහත සඳහන් කුමන ක්‍රමය උපයෝගී කරගත හැකිද?
(1) යපස් තනුක නයිට්‍රික් අම්ලයේ ද්‍රවණය කර සම්මත $KMnO_4$ ද්‍රාවණයක් සමඟ අනුමාපනය කිරීම.
(2) යපස් සාන්ද්‍ර නයිට්‍රික් අම්ලයේ ද්‍රවණය කර සම්මත $K_2Cr_2O_7$ ද්‍රාවණය සමඟ අනුමාපනය කිරීම.
(3) යපස් සාන්ද්‍ර හයිඩ්‍රොක්ලෝරික් අම්ලයේ ද්‍රවණය කර සම්මත $KMnO_4$ ද්‍රවණයක් සමඟ අනුමාපනය කිරීම.
(4) යපස් තනුක සල්ෆියුරික් අම්ලයේ ද්‍රවණය කර සම්මත $K_2CrO_4$ ද්‍රවණයක් සමඟ අනුමාපනය කිරීම.
(5) මින් එකක්වත් උපයෝගී කරගත නොහැකිය.

## රසායන විද්‍යාව II
### 'අ' කොටස - ව්‍යුහගත රචනා

1. L, M, Q සහ R යනු යෝජියම්වලින් පටන්ගෙන ආගන්වලින් අවසාන වන ආවර්තයට අයත් අනුයාත මූලද්‍රව්‍ය හතරකි. පරමාණුක ක්‍රමාංක පිළිවෙලින් (Z-1), Z, (Z+1) සහ (Z+2) වන L, M, Q සහ R යන මේවායේ පළමුවැනි අයනීකරණ ශක්තිවල විචලනය පහත දක්වා ඇත.




www.sinhalalibrary.com

Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

